**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව ;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය (අදාළ පරිදි) ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 49 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වුවද, එම සමාගම ආශ්‍රිත සමාගමක් ලෙස සලකා ගිණුම් තැබීම හෝ ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ඍජු අධීක්ෂණයට ලක්වන බැවින් හා පනතකින් ස්ථාපිත කර ඇති බැවින් දිගුකාලීන ආයෝජනයක් ලෙස සලකා ගිණුම් තබනු ලැබේ. | ආශ්‍රිත සමාගම් සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.මිලියන 1.32 ක ස්ථාවර තැන්පතු පොලී මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 48 ඡේදයට පටහැනිව 1984 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.මිලියන 104.36 ක් හා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.මිලියන 52.51 ක් එකිනෙකට | ශිෂ්‍යත්ව අරමුදලට අදාල ස්ථාවර තැන්පතු පොලී එම ගිණුමට බැර කර ඇති අතර නාගරික සංවර්ධන අධිකාරිය නමින් සමස්ථ ශේෂය ගිණුම්වල පෙන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ලැබිය යුතු හා ගෙවියයුතු ශේෂ වෙනමම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හිලව් කර රු.මිලියන 51.84 ක ගෙවිය යුතු ශේෂයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි සඳහන් නියමයන්ට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරුකළ රු.මිලියන 20.63 ක මුදල් නොවන ගනුදෙනු වටිනාකමද මුදල් ගලායාමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා තිබුණි. | සංශෝධිත මුදල් ප්‍රවාහය සකස්කර ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කල යුතුය. |
| (ඈ) | හුවමාරු නොවන ගනුදෙනුවක් ලෙස 1987 හා 1988 වර්ෂවල අත්පත් කරගෙන තිබූ හන්තාන නිවාඩු නිකේතනයට අයත් පර්චස් 170.56 ක ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,520 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 27 හා 47 ඡේද ප්‍රකාරව එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් අත්පත් කරගත් අවස්ථාවේ නාමික අගයක් සටහන් කර ඇත. තක්සේරුකර ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 15 ඡේදය ප්‍රකාරව අවසන් තොගවල වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් අධිකාරියේ තොගවල ඇතුළත් පාර්ක් රෝඩ්හි පිහිටි කඩසාප්පු 08 ක ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව එහි පිරිවැය වූ රු.මිලියන 6.1 ක වටිනාකම තොගයෙහි අගය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම තොගවල තක්සේරු වාර්තා ලබාගෙන ගිණුම් ගතකරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම් තැබිය යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 ට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් 2018 වර්ෂයේදී කුලී/බදු පදනම මත ලබාදී තිබුණු එකතුව රු.මිලියන 6.21 ක නිවාස දේපළ ඒකක 08 ක් සහ මොරටුව හා | මෙම දේපල විකිණීමට ඇත. විකුණන තෙක් කුලී/බදු පදනම මත ලබාදී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ආයෝජන වත්කම් ගිණුම් තැබීමට කටයුතු කල යුතුය. |

මාළිගාවත්තේ කුලී පදනම මත බැහැර කිරීමට නියමිත කඩසාප්පු 25 ක වටිනාකම ආයෝජන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් විකිණීමට සහ නිවාස ව්‍යාපෘති වෙනුවෙන් අත්පත් කරගත් ඉඩම්වල වටිනාකමට එම ඉඩමේ සංවර්ධනය වෙනුවෙන් දරන ලද වියදම්ද ඇතුළත් කර සංවර්ධන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීම අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය වුවද, එම ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි අධිකාරියට පවරා නොගත් ඉඩම් වල සිදුකරන ලද සංවර්ධන වියදම වූ රු.මිලියන 156.84 ක්ද ඉඩම් සංවර්ධන ගිණුමේ ඇතුලත් කර තිබුණි. | කඩිනම් වැඩසටහන් යටතේ අත්පත් කර ගැනීමේ කටයුතු වලට සමගාමීව ඉඩම් සංවර්ධන කටයුතු සිදුකරන බැවින් එම වියදම් ඉඩම් සංවර්ධන වියදම් ගිණුමේ ගිණුම් ගතකර ඇත. | අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව සංවර්ධන වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන සමග ඉඩම් හා ගොඩනැගිලි වලට අදාලව ඉදිරිපත් කර තිබුණු සටහනට අනුව ඉඩම්වල වටිනාකම රු. මිලියන 55.3 ක් ලෙස දක්වා තිබුණු නමුත් අධිකාරියේ ස්ථිර කාර්යාල ගොඩනැගිලි හා කුලී ගොඩනැගිලි පිහිටි ඉඩම් කොටස් 33 ක, නිවාස යෝජනා ක්‍රමවලින් තවදුරටත් උපයෝජනය නොකර ඉතිරිවී තිබුණු ඉඩම් සහ නිවාස සංවර්ධන අධිකාරියට අයිති බවට හඳුනාගෙන තිබුණු ඉඩම් හෙක්ටයාර් 437.7 ක වටිනාකම තක්සේරුකර ගිණුම් ගතකර නොතිබුණි. | වරලත් තක්සේරුකරුවෙකු හෝ තක්සේරු ආයතනයක් තෝරාගෙන ඉඩම් හා ගොඩනැගිලිවල නිවැරදි තක්සේරුවක් කර ගිණුම්ගත කරනු ලැබේ. | අධිකාරියට අයත් වත්කම් හඳුනාගෙන ඒවායේ තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙනත් ආයතනවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අධිකාරියට ආයතන 23 කින් ලැබුණු රු.මිලියන 705.69 ක් සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ප්‍රදාන යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී එම ගිණුමට රු. මිලියන 9.88 ක් ලැබී තිබුණු අතර එයින් රු.මිලියන 6.95 ක් වැයකර තිබුණි. එසේ වුවත් එම ලැබීම් හා ගෙවීම් අධිකාරියේ ආදායම් හා වියදම් තුල ඇතුළත් නොවන අතර ශුද්ධ ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිඳු හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | මෙම මුදල් අධිකාරියේ සංවර්ධන වැඩ වලට සෘජුවම අදාල නොවන බැවින් ආදායම් වියදම් ගිණුම්වල සටහන් නොකර මුදල් ලැබීම් හා ගෙවීම් වශයෙන් පමණක් සටහන් කරන ලදී. | විශේෂ ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමානවත් හෙළිදරව් කිරීම් සිදුකල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාල 05 ක හා සංචාරක නිවාසයක සිදුකරනු ලබන ඉදිකිරීම් වැඩ වල එකතුව වූ රු.මිලියන 20.91 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාල ගොඩනැගිලි සම්පූර්ණයෙන් ඉදිකර, බිල්පත් ගෙවා අවසන් වූ පසු ස්ථාවර වත්කම් වලට මාරු කරයි. | ස්ථාවර වත්කම් වලට අදාල කෙරීගෙන යන වැඩ නිවැරදිව ගිණුම් ගතකල යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) | වෙනත් ප්‍රදාන (විවිධ පුද්ගලයන්ගෙන් ලැබීම්) | 17.84 | 13.28 | 4.56 | නිවැරදි උපලේඛන ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් උපයෝගී ලියවිලි සමග සසඳා වෙනස්කම් ගැලපීමට කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) සෙවන ප්‍රදාන වියදම් | 3.51 | 8.27 | 4.76 | නිවැරදි උපලේඛන ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් උපයෝගී ලියවිලි සමග සසඳා වෙනස්කම් ගැලපීමට කටයුතු කල යුතුය. |
| (ඇ) ගෙවිය යුතු ණය (දිරිපියස) | 10.13 | 13.96 | 3.83 | මෙම ණය යෝජනා ක්‍රමය අනුව නොගෙවන ණය සඳහා බැංකුව හා අධිකාරිය සම සමව දරා ගත යුතු බැවින් ගෙවිය යුතු ණය වලින් සියයට 50 ක් බැංකුවට අදාල කර ඇත. | ණය ගිවිසුම් අනුව නිවැරදි ණය ශේෂ හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.5.5 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම වූ ඕෂන් වීව් ඩිවෙලොප්මන්ට් සමාගමේ මූල්‍ය වාර්තා 2019 මැයි දක්වා විගණනයට ලබාදී නොතිබුණු බැවින් විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | 2019 අවසන් ගිණුම් සකස් කිරීමේදී 2018 දෙසැම්බර් 31 ට විගණනය කරන ලද අවසන් ගිණුම්වලට අනුව ශේෂයන් නැවත ප්‍රකාශ කරයි. | පරිපාලිත සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට යොදා ගත යුතුය. |
| (ආ) | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පරිපාලිත සමාගමේ අයිතමයන් 05 ක වටිනාකම එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල ගිණුම්වල සඳහන් වටිනාකම් අතර රු.මිලියන 5.72 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 අවසන් ගිණුම් සකස් කිරීමේදී 2018 දෙසැම්බර් 31 ට විගණනය කරන ලද අවසන් ගිණුම්වලට අනුව ශේෂයන් නැවත ප්‍රකාශ කරයි. විගණනය වෙත ලබාදෙන ගිණුම් වාර්තාවම ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට ලබාදෙන ලෙස දන්වා ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල විගණිත මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අධිකාරිය විසින් තම පරිපාලිත සමාගමේ රු.මිලියන 120 ක් ආයෝජනය කර තිබුණු නමුත් 2015 හා 2016 වර්ෂයන්හි පිළිවෙලින් රු.මිලියන 306.57 ක හා රු.මිලියන 126.51 ක බදු පසු ලාභයක් ගිණුම්වල පෙන්නුම් කලද අධිකාරිය වෙත කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. 2018 වර්ෂයේ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පරිපාලිත සමාගමේ රු. මිලියන 108.1 ක බදු පසු ලාභයක් පෙන්නුම් කර තිබුණි. | 2019 වර්ෂයේදී රු.මිලියන 1.512 ක් ලැබී ඇත. 2018 වර්ෂයේ ලාභාංශ ඉල්ලීම් කර ඇත. 2014,2015 සහ 2016 ආදායම් බදු ගණනය කිරීම් අනුව ලාභයක් ඇත. | පරිපාලිත සමාගමේ පාලනය හා ලාභාංශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අධිකාරිය ඵලදායී ලෙස මැදිහත් විය යුතුය. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු.මිලියන | | | |
| (අ) බැංකු ණය | 270.65 | බැංකු සනාථන | ශේෂ සනාථන ලිපි යවා ඇතත් පිළිතුරු නැත. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන්ට අදාල සනාථන හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ආ) ප්‍රදාන | 1,283.35 | උපයෝගී ලියවිලි | අදාල විස්තරාත්මක උපලේඛන සකස් කර ඉදිරිපත් කරමි. | |
| (ඇ) ලැබිය යුතු ශේෂ - දිස්ත්‍රික් කාර්යාල | 7.6 | විස්තරාත්මක තොරතුරු | අදාල විස්තරාත්මක උපලේඛන සකස් කර ඉදිරිපත් කරමි. | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට දැන්වීම් පලකිරීම වෙනුවෙන් සෙවණ මාධ්‍ය අංශය වෙත ලැබිය යුතු මුළු මුදල රු.මිලියන 55.1 ක් | කළමනාකරණය විසින් අදහස් ප්‍රකාශ කර නැත. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | වූ අතර, ආදර්ශ ගම්මාන විවෘත කිරීම්, මුල්ගල් තැබීම් හා අධිකාරියේ අනෙකුත් දැන්වීම් පලකිරීම වෙනුවෙන් සෙවන මාධ්‍ය අංශය වෙත ලැබිය යුතු හිඟ මුදල රු.මිලියන 39.12 ක්ද ඒ තුල විය. | | කල යුතුය. |
| (අ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජන උදාන ඉඩම් විකුණුම් යටතේ රු.මිලියන 4.36 ක් අයවීමට ඇති අතර රත්නපුර ගල්කඩුවවත්ත ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු මුදල රු.මිලියන 8.69 ක් විය. එසේම අධිකාරිය සතු රු. මිලියන 11.28 ක් වටිනා වාහන 05 ක් ගිවිසුමකින් තොරව 1991 වර්ෂයේ සිට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබාදී තිබූ අතර, එම වාහන වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසයෙන් පසු අයවිය යුතු රු.854,056 ක් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් එම සංස්ථාවට ගෙවිය යුතු මුදල් වලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සමස්ථ ණයගැති ශේෂය රු.මිලියන 4,486.72 ක් විය. එම ණය ශේෂය තුළ වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ලැබිය යුතු ණය ශේෂවල එකතුව රු.මිලියන 2,064.03 ක් වූ අතර එය මුළු වටිනාකමින් සියයට 46 ක් විය. සමාලෝචිත වර්ෂයේදී ණය එකතු කිරීමේ කොමිස් සඳහා රු.මිලියන 135.44 ක පිරිවැයක් දරා තිබුණද 2018 වර්ෂයේ ණය අයවීමේ ප්‍රගති වාර්තා අනුව අපේක්ෂිත ණය අයකිරීම් වලින් සියයට 71 ක් පමණක් අයවී තිබුණි. මුළු ණයගැති සංඛ්‍යාවෙන් වසර 05 ට වැඩි ණයගැති සංඛ්‍යාව සියයට 49 ක් වී ඇති බැවින් පැරණි ණය අයකිරීමේ ප්‍රගතිය අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. එසේම, විවිධ රාජ්‍ය ආයතන 3 කින් හා සමූපකාර සමිතියකින් අයවිය යුතු රු.මිලියන 33 ක් එම ආයතන සමඟ සාකච්ඡා කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ හිඟ ණය අයවීම වැඩි කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල මගින් වැඩ සටහන් පවත්වනු ඇත. එසේ වුවද විවිධ හේතු මත එම ණය අයවිම අඩුවි ඇත. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

--------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය හා පෞද්ගලික ආයතන 05 කින් ව්‍යාපෘති සඳහා ලබාගත් ණය සඳහා ගෙවිය යුතු හිඟ ණය හා පොලී රු.මිලියන 855.05 ක්ද පුනරුත්ථාපන අමාත්‍යාංශයට හා ධීවර අමාත්‍යාංශයට ගෙවිය යුතු පිළිවෙලින් රු.මිලියන 130.91 ක් හා රු.මිලියන 89.14 ක්ද වසර 05 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | අධිකාරියේ මූල්‍ය තත්ත්වය මත ගෙවීම් ප්‍රමාද වී ඇත. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම විධිමත් කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු මුළු ණයහිමි ශේෂය රු.මිලියන 1,859.29 ක් වූ අතර එයින් වර්ෂ 05 ට වැඩි ණයහිමි ශේෂය රු.මිලියන 1,078.7 ක් හෙවත් සමස්ත ණයහිමියන්ගෙන් සියයට 58 ක් විය. | ගෙවිය යුතු ණය හා කලින් ලැබූ නාගරික නිවාස කුලී ඉදිරි වර්ෂයේදී නිරවුල් වේ. ගෙවිය යුතු බදු නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම විධිමත් කල යුතු අතර තවදුරටත් වගකීමක් නොමැති ගෙවියයුතු මුදල් සොයාබලා ආදායමට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6.3 අත්තිකාරම්

----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් අභ්‍යන්තර හා බාහිර පුද්ගලයන් වෙත විවිධ කාර්යයන් සඳහා ලබාදුන් අත්තිකාරම්වලින් වසර 03 කට වැඩි කලක සිට ඉදිරියට ගෙන එන ලද රු.මිලියන 195.64 ක් පියවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් අත්තිකාරම් එම වැඩ කොටස් නිමවීමත් සමග පියවීමට කටයුතු කරයි. | අත්තිකාරම් ගෙවීම් පිළිබඳ අභ්‍යන්තර පාලනය විධිමත් කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ11(බී) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8 පරිච්ඡේදයේ 8.2.2 ඡේදය | එකතුව රු.මිලියන 2,263.42 ක කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | භාණ්ඩගාර අනුමැතිය ලබා ගැනීමට ලිපියක් යොමුකර ඇත. | මුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව අදාල අනුමැතීන් මත ආයෝජනයන් කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 395 හා 396 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවී මාස 06 ක කාල සීමාවක් ඉක්මවා තිබුණු දිස්ත්‍රික් කාර්යාල බැංකු ගිණුම් 14 ක රු.මිලියන 8.58 ක චෙක්පත් 198 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් ප්‍රකාශ කර නැත. | යොමුගත මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxviii වැනි පරිච්ඡේදයේ 9 ඡේදය | පැරණි ලිපිගොනු ආරක්ෂා කිරීම හා විනාශ කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | දැනට ලේඛනාගාරයේ කාර්යන් විධිමත්ව අවසන් කරමින් පවතී. එතෙක් පැරණි ලිපිගොනු ආරක්ෂිතව ඇත. | යොමුගත නීති රීති වලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) 2017 පෙබරවාරි 28 දිනැති අංක 04/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ<br>(i) 03 ඡේදය | යොමුගත චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි උපාධිධාරීන්, පුහුණු අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන තිබුණු අතර දිස්ත්‍රික් කාර්යාල 19 ක 2016 සහ 2017 වර්ෂයන්හිදී බඳවාගත් උපාධිධාරීන් 173 ක් 2018 දෙසැම්බර් 31 වන විටත් පුහුණුලාභීන් ලෙසම කටයුතු කර තිබුණි. | සංවර්ධන කටයුතුවල අධික බව නිසා බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් පුහුණුලාභීන්ව යොදා ගන්නා ලදී. | බඳවා ගැනීම් යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූල විය යුතුය. |
| (ii) 04 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව බඳවාගත හැකි පුහුණුලාභීන් සංඛ්‍යාව මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 10 ක් හෝ සේවකයන් 25 ක් වුවද එම ප්‍රමාණය ඉක්මවා පුහුණුලාභීන් බඳවා ගෙන තිබුණි. | සංවර්ධන කටයුතුවල අධික බව නිසා බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් පුහුණුලාභීන්ව යොදා ගන්නා ලදී. | බඳවා ගැනීම් යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූල විය යුතුය. |
| (iii) 06 හා 08 ඡේද | පුහුණුලාභීන්ගේ පුහුණු කාලය මාස 06 ඉක්මවා දීර්ඝ කළ නොහැකි වුවද එම කාලය ඉක්මවා පුහුණු කාලය දීර්ඝ කර තිබුණි. | සංවර්ධන කටයුතුවල අධික බව නිසා බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් පුහුණුලාභීන්ව යොදා ගන්නා ලදී. | බඳවා ගැනීම් යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූල විය යුතුය. |
| (ඉ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනය හා පරිගණක උපාංග ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් සම්බන්ධ ලේඛන හා ලෙජර් ඇති අතර නව පරිගණක වැඩසටහනක් හඳුන්වා දී දැනට එහි නිවැරදිතාව තහවුරු කරමින් පවතී. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය | අධිකාරිය විසින් වසර 03 ක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව අවශ්‍ය ලියකියවිලි නඩත්තු කල යුතුය. |
| (උ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 පරිච්ඡේදයේ 9.4 ඡේදය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන වෙත නිලධාරීන් 26 දෙනෙකු මුදාහැර නිවාස සංවර්ධන අධිකාරිය විසින් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | සැමට සෙවන නිවාස වැඩසටහනට අදාලව රාජකාරි කිරීමට යොදවා ඇත. | යොමුගත චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඌ) | 1994 ජූනි 14 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක) වෙත රු.30,000 බැගින් මාසික දීමනාවක් වැටුපට අමතරව ගෙවා තිබුණි. | අමතර රාජකාරි සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත මෙම ගෙවීම් කරයි. | යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව දීමනා ලබාදීම සිදුකල යුතුය. |

**1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| --------------------- | --------------------- | ----------- |
| එකතු කල අගය මත බදුවලට අදාල යෙදවුම් හා නිමවුම් මත ගෙවූ/ ලැබූ බදු සමඟ ගලපා ලැබිය යුතු හෝ ගෙවිය යුතු බදු ප්‍රමාණය ගිණුම්ගතකිරීම වෙනුවට අධිකාරිය ගෙවා තිබුණු රු.මිලියන 8.76 ක එකතු කල අගය මත බදු ආදායම් ප්‍රකාශනයට ලියාහැර තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැට් බදු සූත්‍රයට අනුව කටයුතු කරයි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ “එකතු කල අගය මත බදු” ගිණුම්ගත කිරීම හා සම්බන්ධ නීති රීති අනුගමනය කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමූහයේ සහ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය පිලිවෙලින් රු. මිලියන 891.01 ක හා රු.මිලියන 999.36 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය පිලිවෙලින් රු.මිලියන 834.17 ක් හා රු.මිලියන 915.7 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමූහයේ සහ අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 56.84 ක හා රු.මිලියන 83.66 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් ආදායම රු.මිලියන 65.41 කින් අඩුවීම හා අනෙකුත් දීමනා (පුහුණු දීමනා ඇතුළත්ව) තොරතුරු හා ප්‍රචාරන වියදම්, රු.මිලියන 133.79 කින් හා රු.මිලියන 93.9 කින් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මහජන උත්සව ක්‍රියාකාරකම් වෙනුවෙන් රු.මිලියන 63.59 ක් වියදම් කර තිබුණු අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී වියදමේ සියයට 92 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි.

(ආ) සහාධිපත්‍ය දේපළ පැවරීම් නිසියාකාරව සිදු නොවීම මත ඒවායේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් අධිකාරිය විසින් රු.මිලියන 282 ක් දරා තිබුණු අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 28 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

### 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වත්කම් අනුපාතය 1.6:1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එය 1.7:1 ක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතය 1.6:1 ක් වූ අතර පසුගිය වර්ෂයේද එම අනුපාතය 1.6:1 ක් වී තිබුණි. ක්ෂණික වත්කම් සම්මත අනුපාතය වන 1:1 ට වඩා වැඩි අගයක් වර්ෂ දෙකෙහිම දක්නට ඇති අතර එය ණයගැතියෝ, තැන්පතු හා අත්තිකාරම්, කෙටිකාලීන තැන්පතු හා අනෙකුත් ජංගම වත්කම් වලින් සියයට 86 ක් නියෝජනය කර තිබුණි.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 51 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී සියයට 81 ක් විය. ඉඩම් විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 65.41 කින් හා නිවාස විකුණුම් ආදායම රු. මිලියන 14.78 කින් අඩුවීම මෙයට බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගම්මානවල මුල්ගල් තැබීමට, විවෘත කිරීමට අදාල ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් සහ ශිලාඵලක, වින්‍යාස පුවරු, නිවාස අංක තහඩු සකස් කිරීමේ කටයුතු වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 23 ක් විසින් එකතුව රු.මිලියන 364.85 ක වියදම් දරා තිබුණි. එම වියදම් වල එකතුව, 2018 වර්ෂයේදී ප්‍රතිලාභීන් වෙත ලබාදුන් රු.මිලියන 826.36 ක ණය හා ආධාර වල වටිනාකම හා සැසඳීමේදී සියයට 44 ක් පමණ වී තිබුණි. | කළමනාකරණය විසින් අදහස් ප්‍රකාශ කර නැත | අධිකාරියේ වියදම් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කල යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව දේපල කළමනාකරණ අංශයට අයත් භාණ්ඩ වර්ග 51 ක අයිතමයන් 239 ක් භෞතිකව අදාල අංශයේ නොතිබුණු බව වාර්තා කර තිබුණි. | අස්ථානගතවූ භාණ්ඩ රන්පොකුණගම ගබඩාවට යවා ඇත. පරීක්ෂා කර බලා තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. | වත්කම් පාලනය විධිමත් කර වත්කම්වල ආරක්ෂාව තහවුරු කල යුතුය. |
| (ආ) 2017 දෙසැම්බර් 28 දින කුලී ගිවිසුමකින් තොරව, සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක - කොන්ත්‍රාත්) වෙත ලබාදුන් නිල නිවාසය සඳහා අධිකාරියට ලැබිය යුතු රු.446,330 ක් අයකර ගෙන නොතිබුණු අතර, එම නිලධාරියාගේ කොන්ත්‍රාත් කාලය 2019 ජනවාරි සිට අවසන් කර තිබුණි. එසේම සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදලේ දායක මුදල් ගෙවීමේ අඩුපාඩු හේතුවෙන් | සහකාර සාමාන්‍යාධිකාරීගෙන් ලැබිය යුතු හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරමින් පවතින අතර සේවක අර්ථසාධක අරමුදල් අඩුවෙන් ගෙවීම හේතුවෙන් දඩ මුදල් ගෙවා ඇත. පාරිතෝෂික ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් | නීතියෙන් බැඳී ඇති ගෙවීම් පරීක්ෂාවේදී අදාල නීතිමය විධිවිධාන අනුව කටයුතු කල යුතු අතර අධිකාරියට ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| රු.428,520 ක දඩ මුදලක්ද විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු වෙත රු.203,669 ක අධිභාරයක්ද අධිකාරිය විසින් ගෙවීම් කර තිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් මෙම අධිභාරය ගෙවීම සිදුකර ඇත. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ තොගයෙහි ඇතුළත් රු.මිලියන 20.43 ක් වටිනා වෙන්කල නිවාස, ඉතිරි නිවාස හා සාප්පු වසර 05 කට අධික කාලයක සිට අලෙවි කර ගැනීමට සහ එම දේපලවලින් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙන්කල නිවාස වලින් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට දිස්ත්‍රික් කාර්යාල මගින් අවශ්‍ය කටයුතු කරන අතර ඉතිරි නිවාස අලෙවි කර ගැනීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලිපි අමාත්‍යාංශය වෙත භාරදී ඇත. | අධිකාරියේ නිවාස තොගය විධිමත් පරිදි කළමනාකරණය කල යුතුය. |
| (ආ) | අනුකූලතා සහතික නොලැබීම මත නිවාස හිමියන්ට අදාල නිවාස පැවරීමට නොහැකිවීම හේතුවෙන් 2018 වර්ෂයේදී සහාධිපත්‍ය දේපළවල හා මහල් නිවාසවල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් අධිකාරිය විසින් රු.මිලියන 290.63 ක් වියදම් කර තිබුණි. | සහාධිපත්‍ය දේපළ ඉදිකිරීමට පෙර ඉඩම් පවරා ගෙන නොතිබීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කර නොතිබීම හා අනුකූලතා සහතික නොමැතිවීම මත අදාල නිවාස දේපල ප්‍රතිලාභීන්ට පවරාදීමට නොහැකිවීම නිසා අළුත්වැඩියා හා නඩත්තු සඳහා අධිකාරියට වියදම් දැරීමට සිදුවී ඇත. | සහාධිපත්‍ය දේපළවල අයිතිය පැවරීම හා සම්බන්ධ ක්‍රියාවලිය විධිමත් කර අධිකාරියේ වියදම් ඵලදායී ලෙස කළමනාකරණය කල යුතුය. |
| (ඇ) | බාහිර පාර්ශවයන් විසින් ඉඩම් හා නිවාස පැවරීම, නිවාස ඉදිකිරීම, පාරිතෝෂික ගෙවීම හා සේව්‍ය සේවක ගැටළු හේතුවෙන් එකතුව රු.මිලියන 31.4 ක වන්දි ඉල්ලා අධිකාරියට එරෙහිව නඩු 66 ක් අධිකරණයේ ගොනුකර ඇති අතර, අධිකාරිය විසින් බාහිර පාර්ශවයන් 1,125 ක් වෙත හිඟ කුලී නොගෙවීම, ඉඩම් පවරා ගැනීම හා ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් රු.මිලියන 89.26 ක් වන්දි ඉල්ලා නඩු ගොනුකර තිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | ඉඩම් සහ නිවාස පැවරීම හා ඉදිකිරීම කාර්යක්ෂම හා ඵලදායී විය යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ අවස්ථා 07 කදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත රු.මිලියන 66 ක අත්තිකාරම් මුදලක්, පසුව ලබා ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය වටිනාකමෙන් ආවරණය කර ගැනීමේ පදනමින් ලබාදී තිබුණු නමුත් ඒ සඳහා ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. එම වර්ෂයේදී යථෝක්ත අත්තිකාරම් මුදලින් රු.මිලියන 20.47 ක් නැවත මුදලින් පියවා තිබුණි. | සභාපතිගේ අනුමැතිය සහිත ලිපි ඉදිරිපත් කරමි. | අභ්‍යන්තර ගෙවීම් විධිමත් පරිදි කළමනාකරණය කල යුතුය. |
| (ආ) | ඉන්දියානු ආධාර යටතේ දකුණු පළාත් විශේෂ නිවාස වැඩසටහන මගින් 2018 වර්ෂය තුළ නිවාස ඒකක 600ක් ආරම්භ කිරීමට ඇස්තමේන්තු කර නිවාස ඒකක 25 ක් නිම කිරීමට සැලසුම්කර තිබුණද නිවාස ඒකක 581 ක් ආරම්භ කර ඇතත් එකදු නිවසක් හෝ 2018 වර්ෂය අවසාන වන විට නිමකර නොතිබුණි. සම්පත් සෙවණ, සෙවන ආධාර හා ග්‍රාම ශක්ති නිවාස වැඩසටහන් යටතේ පිළිවෙලින් නිවාස ඒකක 1,560 ක, 1,115 ක හා 100 ක වැඩ නිම කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී පිළිවෙලින් නිවාස ඒකක 152 ක, 12 ක හා 72 ක පමණක් වැඩ නිමකර තිබුණි. එසේම අවිච්ඡේද වැඩසටහන යටතේ පිළිවෙලින් ග්‍රාම ශක්ති හා සම්පත් සෙවණ නිවාස ඒකක 1,301 ක හා නිවාස 8,827 ක වැඩ නිමකිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩ නිමකර තිබුණේ නිවාස ඒකක 515 ක හා 3,273 ක පමණක් විය. | ඉන්දියානු ආධාර නිවාස සඳහා ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයෙන් ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාදවිය. එසේම ප්‍රතිලාභීන්ගේ සහභාගී ප්‍රතිපාදන යෙදවීමේ ප්‍රමාදය හේතුවෙන් නිවාස වැඩසටහන් ප්‍රමාද වී ඇත. | මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | 80/90 දශකය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බදු පදනම යටතේ ලබාදුන්, ගම්මාන 12 කට අදාල හෙක්ටයාර් 60.59 ක්වූ ජනඋදාන ඉඩම් කොටස් 413 ක තක්සේරු වටිනාකම රු.මිලියන 13.48 ක් වූ අතර මෙම මුදල් අයකරගෙන ප්‍රතිලාභීන්ට පවරාදීමට කටයුතු කර නොතිබුණි. තවද, එම දශකයේ ජන උදාන ගම්මාන 03 ක වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 7.459 ක් වූ ඉඩම් කොටස් 44 ක වටිනාකම අධිකාරිය | පවරා ගෙන ඇති ඉඩම්වල තක්සේරු කටයුතු අවසන් කර තක්සේරු අංකය පදිංචිකරුවන් වෙත ලබාදී ඇත. පවරාගෙන නැති ඉඩම්, තක්සේරු කිරීමට නොහැකිවී ඇත. ආදර්ශ ගම්මාන ඉදිකල ඉඩම්ද පවරා ගැනීමට කාලානුරූපීව ප්‍රමාද වී ඇත. | අධිකාරියේ වත්කම් පාලනය විධිමත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විසින් තක්සේරු කිරීමට පියවරගෙන නොතිබුණි. ආදර්ශ ගම්මාන ඉදිකිරීමට 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා යොදා ගන්නා ලද රජයට අයත් ඉඩම් කොටස් 77 ක් හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කොටස් 08 ක අයිතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අධිකාරිය වෙත පවරා ගෙන නොතිබුණි. එසේම පවරාගෙන නොමැති ඉඩමක ඉදිකල මහව උදාගම නිල නිවාස 03 කින් අධිකාරියට ලැබිය යුතු හිඟ කුලිය රු.මිලියන 1.32 ක් විය. එසේම අනුරාධපුර ඉපලෝගම පුලියන්කුලම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ඒ සඳහා අවශ්‍ය නිර්දේශ හා අනුමැතීන් ලබාගෙන නොතිබුණු අතර අක්කර 10 ක්වූ අදාල ඉඩම පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(ආ) වගන්තියට අනුව අධිකාරිය විසින් භුක්තිය භාරගෙන තිබුණු ඉඩම් කැබලි 72 ක් පවරා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 178.25 ක ප්‍රතිපාදන සිදුකර තිබුණි. එම අගය තුළ වසර 39 කට වැඩි පැරණි ශේෂයන් ද ඇතුළත් නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම වන්දි හා පොලී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් විසින් වන්දි තක්සේරුව දන්වා එවා නැත. ඒ පිළිබඳ ඉල්ලීම් කර ඇත. | ඉඩම් පවරා ගැනීමේ හා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කල යුතුය. |

## 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෙවන අරමුදල සඳහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් පාර්ශවයන්ගෙන් ලැබූ ආධාර ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු.මිලියන 938.25 ක් වුවද අරමුදලේ අරමුණු සඳහා 2018 වර්ෂයේදී උපයෝජනය කර තිබුණේ රු.මිලියන 70.25 ක් පමණි. | සෙවන අරමුදලේ මුදල් සෙවන පාලක මණ්ඩලයේ අනුමැතිය මත ආධාරලාභීන්ගේ ඉල්ලීම් මත නිදහස් කරයි. | කාර්යක්ෂම හා ඵලදායී ලෙස අරමුදල් උපයෝජනය කල යුතුය. |

## 3.6 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.4 වගන්තියට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය වන විට නිලධාරීන් 38 දෙනෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වෙනත් රාජ්‍ය ආයතනවල රාජකාරි කටයුතුවල යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් අධිකාරියට රු.මිලියන 71.04 ක් අයවිය යුතුව තිබුණි. එයින් රු.මිලියන 70.96 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි. | මෙම මුදල පොත්වලින් ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමුකර ඇත. | මානව සම්පත් කළමනාකරණය විධිමත් කල යුතු අතර ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් මාණ්ඩලික තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී, බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම්වල ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් නොතිබීම, ප්‍රසිද්ධ දැන්වීම් පලකර නොතිබීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වා නොතිබීම හා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශේෂ දීමනා එකතු කර වැටුප් ලබාදීම සිදුකර තිබුණි. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය වෙත කොන්ත්‍රාත් පදනම මත පත්වීම් 1,486 ක් අනුමතකර තිබුණද, 2019 පෙබරවාරි 28 දින අධිකාරිය විසින් අනුමත බඳවා ගැනීම් පරිපාටියේ සුදුසුකම්වලට අනුකූල නොවන පරිදි තනතුරු නාමයන්හි වෙනස්කම් සහිතව හා අනුමත නොකල තනතුරු සඳහා කොන්ත්‍රාත් පත්වීම් 2,214 ක් ලබාදී තිබුණි. 2018 වර්ෂය තුලදී විධිමත් අනුමැතියකින් තොරව වයස අවුරුදු 60 ට වැඩි විශ්‍රාම ලැබූ නිලධාරීන් 31 ක් සේවා දිගු ලබාදීම මගින් හා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයට බඳවා ගෙන තිබුණි. | නිවාස සංවර්ධන කටයුතු කඩිනම්ව කර ගැනීම සඳහා අදාල පත්වීම් ලබාදී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සංවර්ධන කාර්යයන් කඩිනම් කිරීමට විශ්‍රාමික නිලධාරීන්ව සේවයේ යොදවා ඇත. | සේවකයන් බඳවා ගැනීම විධිමත් කල යුතුය. |

## 3.8 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහන 18 ක් වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.මිලියන 41.99 ක් කල්බදු කුලී ගෙවා තිබුණද අධිකාරිය කුලී වාහන සඳහාද 2018 වර්ෂයේදී රු.මිලියන 82.46 ක් ගෙවීම් කර තිබුණි. එසේම 2018 වර්ෂයේ වාහන නඩත්තු වියදම රු.මිලියන 20.47 ක් විය. | නිවාස සංවර්ධන කාර්යයන් පුළුල්වීම හා වාහන මිලදී ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය නොලැබීම නිසා කුලී වාහන යොදා ගනී. එසේම පැරණි වාහන නිතර ආපදාවන්ට ලක්වීමද සිදුවේ. | වාහන පාලනය විධිමත් කල යුතු අතර අධිකාරියේ වියදම් මනා ලෙස කලමනාකරණය කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව නිවාස සංවර්ධන අධිකාරිය විසින් සැමට සෙවණ මූලික අරමුණ සමඟ දිවයිනේ සෑම පවුලකටම පරිසර හිතකාමී, තිරසර, ගුණාත්මක හා ස්ථිරසාර ආරක්ෂිත, මූලික පහසුකම් සහිත නිවසක ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණු අතර, නිවාස ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ණය හා ආධාර ලබාදීම, නිවාස ඉදිකිරීමට අවශ්‍ය තාක්ෂණ හා වෙනත් සහායන් ලබාදීම, පදිංචිකරුවන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම, අවශ්‍ය ඔප්පු ලබාදීම ආදී කාර්යභාරයන් සිදුකරමින් පවතී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (අ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන අදාල ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය වන බව නිරීක්ෂණය වුවද එම සහභාගීත්වයේ සාර්ථකත්වය අඩු | කළමනාකරණය විසින් අදහස් දක්වා නැත. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මට්ටමක පැවති අතර, අධිකාරිය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළගාවීම මැනබැලීම සඳහා ගොඩනහා තිබුණු දර්ශකවල සාර්ථකත්වය මැනබැලීම කාලීනව සිදුකර නොතිබුණි. | | |
| (ආ) | තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීම සඳහා ආයතනය විසින් ඉලක්කගත කාර්යයන් හඳුනාගෙන වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නැත. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | තිරසර සංවර්ධන ඉලක්ක ළගාකර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතනවල සැලසුම් සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළගාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය දූර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. | කළමනාකරණය විසින් අදහස් දක්වා නැත. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |